Alcohol and Drug Information Centre
ADIC

No.40/18, Park Road, Colombo 05, Sri Lanka.
Tel: +94 11 2584416,+94 11 2592515, Fax: +94 112508484
Email: info@adicsrilanka.org
Web site: http//www.adicsrilanka.org

# සිගරට් කර්මාන්තය පතුරුවන බොරු ප්‍රචාරයන්ට හසුනොවෙමු, හෙළිකරමු.

පසුගිය වසරේ අපේ රටේ සිගරට් බදු වැඩිකිරීම මගින් සාමාන්‍ය සිගරට්ටුවක මිල රු. 50 ක් දක්වා ඉහල නැංවීමට රජය කටයුතු කල බව නොරහසකි. එම මිල වැඩිවීම සම්බන්ධයෙන් සිගරට් සමාගම විසින් වෙනදාට වඩා වැඩි වශයෙන් නොයෙක් සාවද්‍ය මතයන් ජනමාධ්‍ය හරහා ජනගත කිරීමේ උත්සාහයක් වර්තමානය වන විට දක්නට තිබේ.

එහිදී,

01. සිගරට් මිල වැඩි වීම නිසා සිගරට් භාවිතයේ සිටි පිරිස මේ වන විට බීඩි භාවිතයට යොමුව ඇති බව සිගරට් සමාගම විසින් සාවද්‍ය මතයක් ජනගත කරමින් පවතී.

සිගරට් කර්මාන්තය බොහෝ කාලයක් මුළුල්ලේ සිදුකරන මෙම ප්‍රකාශය පසුගිය මිල සංශෝදනයෙන් අනතුරුව වැඩි වශයෙන් ජනගත කිරීම සිදුකලත් මෙහි සත්‍යතාවක් නොමැති බව පදනමක් සහිතව පෙන්වා දිය හැක්කේ බීඩි නිෂ්පාදනය සඳහා ආනයනය කරනු ලබන තෙන්දු කොල ආනයනන විශාල ලෙස ඉහල ගොස් නොමැති බව රේගු වාර්තා පෙන්වා දෙන බැවිනි. එසේ තිබියදී සිගරට් බදු වැඩිකිරීමට රජය සාකච්ඡා කරමින් සිටියදී සිගරට් සමාගමට වාසි වන පරිදි තෙන්දු කොළ ආනයනය කිරීමේ ප්‍රමාණයන් හි දත්ත වසර කිහිපයක් මගහරිමින් ප්‍රත්පත්ති සම්පාදකයන්ට ඉදිරිපත් කිරීම සිදුවිය. එමගින් මුදල් අමාත්‍යංශය පවා නොමග යැවීමට හැකිවූ අතර මුදල් ආමාත්‍යංශය මගින් කැබිනට් මණ්ඩලයට ලබා දුන් වාර්තාවේද එම සාවද්‍ය තොරතුරු අඩංගු විය. එමනිසා සිගරට් සමාගම විසින් සිය ව්‍යාපාරය සඳහා ඇතිවන පාලනයන් සූක්ෂම ලෙස අඩපණ කිරීම සඳහා බීඩි කර්මාන්තය හුවා දැක්වීම සිදුකරයි.

ඇමුණුම 01




බීඩි වැනි මිල අඩු සිගරට් නිෂ්පාදන සඳහා යොමුවීම සිදුවන්නේ සිගරට් මිලදී ගැනීමේ හැකියාව අවම වීම නිසා යැයි සිගරට් සමාගම පැවසුවත්, සිගරට් පාරිබෝගිකයෙක් එක් වරම සිගරට් භාවිතයේ සිට බීඩි භාවිතයට යොමුවීම සිදුනොවේ. සිගරට් භාවිතා කරන්නන් හට මිල මගින් එවන් බලපෑමක් සිදුවන්නේ නම් සිගරට් සමාගම විසින්ම නිෂ්පාදනය කරන මිල අඩු සිගරට් වර්ග සඳහා යොමුවිය හැකිය. එහෙත් පසුගිය වසර 20 පුරාවට දත්ත සංසන්දනය කිරීමෙන් එම අඩු මිල සිගරට් භාවිතය දිරිමත් වීමක් පාරිබෝගිකයන් තුළ සිදු වී නැති බව පෙනෙන්නට තිබේ.

සිගරට් සමාගම විසින්ම නිෂ්පාදනය කරන මිල අඩු සිගරට් පසුගිය වසර 12 ක දත්ත 2004 - 2016




සිගරට් මිල වැඩිවීම සමග බීඩි සඳහා මිනිසුන් යොමුවන්නේ නම් සිගරට් සමාගමට අඩු මිල සිගරට් වැඩිවශයෙන් වෙළඳපොළ සඳහා යොමුකිරීමට අවස්ථාවක් නිරායාසයෙන් පැවතින. ආසන්නතම සිගරට් මිල වැඩිවීමේදී සිගරට් සමාගමේ අඩුම මිල සහිත කැප්ස්ටන් වෙළඳනාමය සහිත සිගරට් මිල කිසිම ආකාරයකින් ඉහල නොගිය අතර, පාරිබෝගිකයන්ට ඒවාට යොමුවීමේ හැකියාව තිබිණි. ඉහත ප්‍රස්ථාරය අනුව මිල අඩු සිගරට් භාවිතයේ සුවිශේෂී වැඩිවීමක් පෙන්නුම් නොකරයි. එසේ නම් බීඩි භාවිතය වැඩිවීම සඳහාද සිගරට් මිල ඉහල යාම හේතුවක් බව සිදුකෙරෙන ප්‍රකාශයන් පදනමක් නොමැති සාවද්‍ය ඒවා බව සනාථ කරයි.

02. බීඩි වලට අමතරව මේ වන විට හොර සිගරට් ගෙන්වීම හා භාවිතය ඉහල ගොස් ඇති බව සිදුකෙරෙන ප්‍රකාශයන් මගින් සිගරට් සම්බන්ධයෙන් ඉදිරියේදී ගැනීමට නියමිත පාලන ප්‍රතිපත්තීන් අධෛර්‍යමත් කිරීමට උත්සහ කරන ආකාරයක් පෙනේ.

මේ වන විට අපේ රටේද නොයෙක් ප්‍රදේශ වලින් වාර්තාවන හොර සිගරට් සම්බන්ධ සිද්ධීන් වඩාත් උළුප්පා පෙන්වීම, ප්‍රතිපත්තී සම්පාදකයන් නොමග යැවීමට සිගරට් සමාගම් විසින් සිදුකරන එක් උපක්‍රමයකි. සිගරට් බදු ඉහල අගයක පවත්වාගෙන යාම සාධණීය සිගරට් පාලන ක්‍රමවේදයක් ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් යොජනා කර තිබේ. එම නිර්ණායකයන් හොඳින් ක්‍රියාත්මක කරන රාජ්‍යන් තුලට සිගරට් ගෙන ඒම පිටුපස ඇත්තේ ද බහුජාතික සිගරට් සමාගම් බව විවිධ අවස්ථාහිදි හෙළි වී තිබේ.

03. මිල වැඩිකිරීමෙන් අනතුරුව සිගරට් භාවිතය අඩු වීමේ ප්‍රථිඵලයක් ලෙස රජයට උපයාගත හැකිව තිබූ සුරාබදු ආදායම විශාල ලෙස අහිමි වන බව තවත් සාවද්‍ය මතයක් ප්‍රතිස්ථාපනය කිරීම සිදුකරයි.

මෙම පුරෝකථනය සිදුකිරීමේ දී සිගරට් මිල වැඩිවීම නිසා භාවිතයෙන් ඉවත්වීම සිදුවන බැවින් ඉන් රජයට එක්කර ගතහැකිව තිබූ බදු නොලැබී යන බව පෙන්වා දුන්නත්, මෙතෙක් කල් සිගරට් සඳහා නොතිබූ වැට් බද්ද පැනවීම මගින් රජයට ලැබෙන ආදායම පිළිබඳ සඳහන් කිරීමට සමාගම උත්සුක නොවේ. සිගරට් සඳහා පාලන නියාමනයන් ඇතිකිරීම මගින් කර්මාන්තය බිඳවැටෙන බව හා ඒ ආශ්‍රිත රැකියා අහිමි වන බව වැනි නොයෙක් ප්‍රකාශ මේ වනවිට ජනගත කරමින් පවතී. රජය විසින් වැට් බදු පැනවීමෙන් අනතුරුව ගෝල්ඩ් ලීෆ් සිගරට් එකක මිල රු. 48.30 ක් වූ අතර එය සමාගම මගින් රු. 50 දක්වා ඉහල දමන්නේ රු. 1.70 ක් එකතු කිරීමෙනි. එසේ එක් නොකලේ නම් එම වර්ගයේ සිගරට්ටුවක් රු. 48- 49 පවත්වාගෙන යාමට හැකිය. එහෙත් එම මිල වැඩිකිරීමෙන් ඔවුන්ට අවාසියක් නොවන බව දන්නා දුම්කොළ සමාගම මිල වැඩිකිරීම මගින් විශාල අමතර අදායමක් උපයා ගැනීමට කටයුතු කරන ලදී. බදු වැඩිකිරීම මගිනුත් වාසි ලබාගත් දුම්කොළ සමාගම මේ වන විට කිඹුල් කඳුළු හෙලන බව පෙනෙන්නට තිබේ.

"රජයක් ලෙස සිගරට් කර්මාන්තය වැනි කර්මාන්තයක් සඳහා වරප්‍රසාදයන් ලබාදී පවත්වා ගත යුතු නැත. ලෝකයේ කිසිදු සංවර්ධනය වෙමින් පවතින රටක් දුම්කොළ කර්මාන්තය කිසිසේත් දිරිමත් නොකල යුතු බව" ලෝක බැංකුව පවා අවධාරණය කොට ඇත. දුම්කොළ කර්මාන්තය එසේ පවත්වාගැනීමෙන් උරුම වූ ප්‍රතිවිපාකයන් අපේ රටද මෙන්ම සමස්ත ලෝකයම අත්විඳිමින් සිටී. සිගරට් හා මද්‍යසාර වැනි නිෂ්පාදන මගින් යැපෙන ආර්ථිකයක් තිරසර බවකින් තොර එකක් වනු ඇත.

මාධ්‍ය සාකච්ඡාව - "දුම්කොළ සිගරට් කර්මාන්තය විසින් පතුරුවන සාවද්‍ය මතයන් රටට හෙළිකරමු"

මද්‍යසාර මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය හා දුම්කොළ කර්මාන්තය අධ්‍යන මධ්‍යස්ථානය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

2017. 04. 28